# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.20 පැය 1400 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | /Media/Out/788/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**කොටහේන ශාන්ත ලූසියා දේවස්ථානයේ සිට කොච්චිකඩේ අන්තෝනි දේවස්ථානය දක්වා පැවැත්වීමට නියමිත පා ගමන සහ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේදී පැවැත්වෙන විශේෂ දේව මෙහෙය වෙනුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම**

2025.04.21 වන දින කොටහේන පොලිස් වසමේ පිහිටි කොටහේන ශාන්ත ලූසියා දේවස්ථානයේ සිට වෙරළබඩ පොලිස් වසමේ පිහිටි කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය දක්වා පාගමනක් පවත්වා අනතුරුව කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ පැවැත්වෙන විශේෂ දේව මෙහෙයක් පැවැත්වීමට කටයුතු සැලැසුම් කර ඇත.

මෙම පා ගමන උදෑසන 07.00 ට කොටහේන ශාන්ත ලූසියා දේවස්ථානයෙන් ආරම්භ කර බොංජීන් හන්දියෙන් වමට හරවා ගල්පොත්ත වටරවුමෙන් ගල්පොත්ත වීදිය හරහා ජම්පටා වීදියට ගමන් කර ජම්පටා වීදිය ඔස්සේ වෙරළබඩ ශාන්ත අන්තෝනී දේවස්ථානය දක්වා ගමන් කිරීමට නියමිතව ඇත.

ඒ අනුව එදින උදෑසන 07.00 සිට උදෑසන 11.45 දක්වා වරින්වර වෙරළබඩ පොලිස් වසමේ පහත මාර්ගයන් තාවකාලිකව වසා තැබීම සිදු කරන බැවින් ඇති විය හැකි රථවාහන තදබදය අවම කර ගැනීම සඳහා හැකිතාක් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

**වසා තැබෙන මාර්ගය**

- මෝදර දෙස සිට පිටකොටුව දෙසට ගමන් කරන රථ වාහන කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ඉදිරිපිටින් ගමන් කිරීම

**විකල්ප මාර්ගය**

- හෙට්ටියාවත්ත හන්දියෙන් වමට හරවා ආමර් බාබර් හන්දියෙන් මරදාන දෙසට ගමන් කර ටෙක්නිකල් හන්දිය ඔස්සේ වමට හරවා පිටකොටුව දෙසට ගමන් කළ හැකිය.

**වසා තැබෙන මාර්ගය**

- පිටකොටුව දෙස සිට මෝදර දෙසට ගමන් කරන රථවාහන කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානය ඉදිරිපිටින් ගමන් කිරීම

**විකල්ප මාර්ගය**

- රෙක්ලමේෂන් පාර, වෛනා වීදිය හන්දියෙන් ප්‍රධාන වීදියට පිවිස ගැස්පහ හන්දිය හරහා ආදුරුප්පු වීදිය පොලිසිය මාර්ගයෙන් මහ විද්‍යාල මාවත වතුර ටැංකිය අසලින් ආමර් බාබර් දෙසට ගමන් කර ආමර් බාබර් හන්දියෙන් වමට හරවා ජෝර්ජ් ආර් ද සිල්වා මාවත ඔස්සේ හෙට්ටියාවත්ත හන්දියෙන් දකුණට හැරී මෝදර දෙසට ගමන් කළ හැකිය
- එමෙන්ම, වරකා හන්දියෙන් ජින්තුපිටිය මාර්ගය ඔස්සේ මැලිබන් හන්දියෙන් දකුණට හැරී වතුර ටැංකිය අසලින් මහ විද්‍යාල මාවත ඔස්සේ ආමර් බාබර් දෙසට ගමන් කර ආමර් බාබර් හන්දියෙන් වමට හරවා ජෝර්ජ් ආර් ද සිල්වා මාවත ඔස්සේ හෙට්ටියාවත්ත හන්දියෙන් දකුණට හැරී මෝදර දෙසට ගමන් කළ හැකිය
- තවද, ශාන්ත අන්තෝනි මාවතේ කොච්චිකඩේ ශාන්ත අන්තෝනි දේවස්ථානයේ ඉදිරිපිටින් ගමන් කරන මාර්ගයේ වම් පස මංතීරු දෙක වසා තැබුවද එම මාර්ගයේ දකුණු පස මංතීරු දෙක විවෘතව තබමින් සහ විටින් විට වසා තබමින් ශාන්ත අන්තෝනි මාවතේ වරකා හන්දියේ සිට හෙට්ටියාවත්ත දෙසට එම දකුණු මංතීරුව ඔස්සේ රථවාහන ගමන් කරවීමට හැකියාව ඇත.

**වසා තැබෙන මාර්ගය**

- ක්‍රිස්ටි පෙරේරා වටරවුමේ සිට කොච්චිකඩේ පල්ලිය දක්වා ගමන් කළ හැකි ජම්පටා වීදිය මාර්ගය

**විකල්ප මාර්ගය**

- ජෝර්ජ් ආර් ද සිල්වා මාවත ඔස්සේ ආමර් බාබර් හන්දිය දෙසට ගමන් කර දකුණට හරවා මහ විද්‍යාල මාවත ඔස්සේ ගමන් කර අතුරු මාර්ගයන් වන සංසමිත්තා මාවත, නව හෙට්ටි වීදිය, විවේකානන්ද මාවත වෙත පිවිසිය හැකිය.

ඉහත නිවේදනය සම්බන්ධව මහජනතාවගේ සහ රියදුරන්ගේ දැන ගැනීම සඳහා ඔබ මාධ්‍ය ආයතනය මඟින් ප්‍රචාරයක් ලබා දීමට කටයුතු කර දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**